# ගෑස් පෙන්නන ගෑස්

පසු ගිය සති කිහිපය පුරාවටම හැමෝගෙම ලොකු කලබලයක් දකින්නට ලැබුණා. පාර දිගේ දිග පෝලිම් .එක් පෝලිමක අවසානයේ සිට පෝලිමේ ආරම්භය දක්වා දිගට මමත් ඇවිදගෙන ගියා. පෝලිම නතර වුනේ ගෑස් කඩයක් ළඟින්. ගෑස් හිඟයක්වත් ද? පෝලිමේ සිටි කිහිප දෙනෙකුගෙන් විමසා සිටියා. “ඔව්. කොහේවත් ගෑස් නැහැ. තැන් කීපයකටම ගියා. අද ගෑස් එකක් අරගෙන ගියේ නැත් නම් ගෙදර කෑම උයා ගන්න විදිහකුත් නැහැ. අපි මෙහේ දර ලිපවල් කොහේ හදන්නනද . ගෑස් නැත්නම් බඩගින්නේ තමයි ඉන්න වෙන්නේ. ගෑස්වල වටිනාකම අපිට දැනෙන්න මෙහෙම වෙලාවක් එන්නම ඕන.”

අපි කව්රුත් හිතුවෙ නැහැ නේද ගෑස් නැතිව ගියොත් අපිට මේ තරම් ප්‍රශ්නයක් වෙයි කියලා. ඇත්ත. දර ලිපක් හෝ වෙන යම් ක්‍රමයක් හෝ සකසා ගත හැකි අයකුට නම් ගෑස් නැති වීම එතරම් ගැටලුවක් නොවනු ඇත. සමහර වෙලාවට නම් අපි කියන්නේ ගෙදර උයන්න බැරි නම් කඩෙන් කෑම එකක් ගේනවා කියලා. ඒත් ගෑස් නැති වුනොත් කඩේ ලිප ඇවිලෙන්නෙත් නැහැනේ. ඒ වගේ වෙලාවක් ආවම තමයි අපේ ඇසුත් ඇරෙන්න ගන්නේ.

අපි මේ දුවලා දුවලා ගිහින් පෝලමේ ඉඳලා අරගෙන එන ගෑස් සිලින්ඩරයේ බර ගැන නිකමටවත් හිතුව ද? ඒ ගැන හිතන්න වෙලාවක් අපිට කොහේද ? උදේට ඉක්මනින් කෑම ටික හදනවා .ගෑස් එක ඕෆ් කරනවා. ගෙදරින් එනවා. හවසට යනවා. කෑම ටික උයනවා. ගෑස් එක ඕෆ් කරනවා. හැමදාම මේ ටිකම තමයි. නාගරිකව ජීවත් වෙන බහුතරයකගේම ජීවිතය ගෙවෙන්නේ මේ විදිහට තමයි. ගෑස් එකේ බර ගැන හිතන්නේ වෙනදට වඩා අඩු කාලයක් ගෑස් සිලින්ඩරේ පාවිච්චි කරොත් තමයි. එදාට දුවගෙන ගිහින් කැලැන්ඩරේ මාර්ක් කරපු දිනේ බලනවා. අද වෙන කොට දින කීයක් පාවිච්චි කරල ද බලනවා. එතකොට තමයි තේරෙන්නේ වෙනද පාවිච්චි කරපු විදිහටම පාවිච්චි කරලත් අඩු කාලයකින් ඉවර වෙලා නේද කියලා.

මේ වගේ වෙලාවක තමයි මේ සම්බන්ධයෙන් තියෙන නීති ගැන හොයන්න උනන්දු වෙන්නේ . 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ නිකුත් කරන ලද ගැසට් නිවේදනයක සඳහන් වෙන්නේ අපි මිලදී ගනු ලබන ගෑස් සිලින්ඩරයේ බර අදාළ ස්ථානයේ දීම මැන බලා ගැනීම සඳහා මිනුම් ඒකක සහ ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් නිරවද්‍යතාවය ප්‍රත්‍යක්ෂණය කරන ලද තරාදියක් තිබිය යුතු බව. මෙම තරාදියෙන් කිරා ගත්තත් නිවැරදි බර තිබේදැයි බලා ගැනීමට නම් අපි නිවැරදි බර දැනගෙන සිටිය යුතුය. එසේ නම් ගෑස් සිලින්ඩරයක් මිල දී ගැනීමේ දී එහි අන්තර්ගත ගෑස් ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා මේ කරුණු පිළිබඳ ඔබ දැනුවත් දැයි බලන්න.




- සිලින්ඩරයේ මුද්‍රා කොට තිබෙන කොටස නොවෙනස් ආකාරයට තිබේදැයි බලන්න
- මිලදී ගනු ලබන පුරවන ලද සිලින්ඩරයේ බර කිරා බලන්න
- ගෑස් රහිත හිස් සිලින්ඩරයේ බර ( Tare Weight (T) ) සිලින්ඩර මුහුණතෙහි සඳහන් කර ඇතිදැයි හොඳින් බලන්න (රූපයෙහි දක්වා ඇති පරිදි )
- පුරවන ලද සිලින්ඩරයේ බරින් ගෑස් රහිත සිලින්ඩරයේ බර ( Tare Weight (T) ) අඩු කරන්න
- එසේ අඩු කිරීමෙන් ලැබෙන අගය සිලින්ඩරයේ සඳහන් කර ඇති අන්තර්ගත ගෑස්වල ශුද්ධ බරට සමාන විය යුතුය.

එහෙම නම් අදින් පස්සේ මිල දී ගන්නා ගෑස් සිලින්ඩරයේ බර සම්බන්ධයෙන් ඔබට කිසිදිනෙක සැකයක් නොහිතනු ඇත. වැඩිපුර දවසක් ගෑස් සිලින්ඩරය පාවිච්චි කිරීමට අවශ්‍ය නම් මනා අරපිරිමැස්මකින් යුක්තව එය සිදු කළ යුතු වනු ඇත. එවිට එය ඔබේ ආර්ථිකයට ද මනා ශක්තියක් වනු ඇත.

සැකැසුම

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය